**2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත**

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 50, 55, 74, 77, 78,79, 96 සහ 98 වගන්තිය සමග කියවිය යුතු 142 වන වගන්තිය යටතේ සෞඛය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

නීතිඥ පවිත්‍රා වන්නිආරච්චි (පා.ම)

සෞඛ්‍ය අමාත්‍ය

2021 මාර්තු මස දින

කොළඹ දී ය.

**නියෝග**

1. මෙම නියෝග 2021 ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ත නිෂ්පාදන (ප්‍රචාරය කිරීමේ) නියෝග යනුවෙන් හදුන්වනු ලැබේ.

2. මෙම නියෝග 2021.------ වන දින සිට බලාත්මක වේ.

3. කිසිදු තැනැත්තකු විසින් යම් ඖෂධයක්, වෛද්‍ය උපකරණයක් සහ සීමාස්ථ නිෂ්පාදනයක් සඳහා ප්‍රමිතිය නියම කර ඇති අවස්ථාවක දී එම ප්‍රමිතියට අනුකූල නොවන්නා වූ යම් ඖෂධයක්, වෛද්‍ය උපකරණයක් සහ සීමාස්ථ නිෂ්පාදනයක් හෝ එම ප්‍රමිතිය නියම කර ඇති යම් ඖෂධයක්, වෛද්‍ය උපකරණයක් සහ සීමාස්ථ නිෂ්පාදනයක් බවට වැරදි වැටහීමක් ලබා දෙන ආකාරයට කිසිදු තැනැත්තකු විසින් එකී යම් ඖෂධයක්, වෛද්‍ය උපකරණයක් සහ සීමාස්ථ නිෂ්පාදනයක් ප්‍රචාරණය කිරීම නොකළ යුතුය.

4. කිසිදු තැනැත්තකු විසින් යම් ඖෂධයක්, වෛද්‍ය උපකරණයක් සහ සීමාස්ථ නිෂ්පාදනයක් සඳහා ප්‍රමිතිය නියම කර නොමැති නමුත් යම් නියමිත ප්‍රකාශනයක එම ඖෂධයක්, වෛද්‍ය උපකරණයක් සහ සීමාස්ථ නිෂ්පාදනය සඳහා වූ ප්‍රමිතිය අන්තර්ගත වන අවස්ථාවක දී එම ප්‍රකාශනයේ අන්තර්ගත ප්‍රමිතියට අනුකූළ නොවන්නා වූ කිසිදු ඖෂධයක්, වෛද්‍ය උපකරණයක් සහ සීමාස්ථ නිෂ්පාදනයක් එම ප්‍රකාශනයේ අන්තර්ගත ප්‍රමිතියට අදාල වන ඖෂධයක්, වෛද්‍ය උපකරණයක් සහ සීමාස්ථ නිෂ්පාදනයක් බවට වැරදි වැටහීමක් ලබා දෙන ආකාරයට ප්‍රචාරණය කිරීම නොකළ යුතුය.

5. කිසිදු තැනැත්තකු විසින් යම් ඖෂධයක්, වෛද්‍ය උපකරණයක් සහ සීමාස්ථ නිෂ්පාදනයක් ප්‍රත්‍යක්ෂභාවය, තත්ත්වය, සංයුතිය හෝ සුරක්ෂිතතාවය සම්බන්ධ සාවද්‍ය, නොමග යවන සුලු, වංචා සහගත හෝ වැරදි වැටහීමක් ලබා දෙන ආකාරයට යම් ඖෂධයක්, වෛද්‍ය උපකරණයක් සහ සීමාස්ථ නිෂ්පාදනයක් ප්‍රචාරණය කිරීම නොකළ යුතුය.

6. කිසිම තැනැත්තකු විසින් අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව යම් ඖෂධයක්, වෛද්‍ය උපකරණයක් සහ සීමාස්ථ නිෂ්පාදනයක් ප්‍රචාරණය හෝ ප්‍රවර්ධනය කිරීම නොකළ යුතුය.

එසේ වුව ද දැනටමත් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් යම් **ඖෂධයක්, වෛද්‍ය උපකරණයක් සහ සීමාස්ථ නිෂ්පාදනයක් සම්බන්ධයෙන් ප්‍රචාරය වෙමින් පවතින වෙළඳ ප්‍රචාරණයන් මෙම රෙගුලාසි ක්‍රියාත්මක වන දිනයේ සිට මසක කාල සීමාවක් තුල අනුමැතිය සඳහා නියමිත ආකෘති පත්‍රයට අනුව ගාස්තු නියෝගයන්හි සදහන් නියමිත ගාස්තු ගෙවා අධිකාරිය වෙත ඉදිරිපත් කල යුතුය.**

**අධිකාරිය විසින් විධිමත් පරිදි ලැබී ඇති අයදුම්පත් සලකා බැලීමෙන් අනතුරුව අධිකාරියේ තීරණය හෝ අනුමැතිය ප්‍රයෝගිකව හැකි ඉක්මනින් අදාල ඉල්ලුම්කරු වෙත ලබා දිය යුතුය.**

7. කිසිම තැනැත්තකු විසින් යම් නියමිත රෝග ආබාධ හෝ අසාමාන්‍ය ශාරීරික තත්ත්ව සඳහා ප්‍රතිකාරයක්, නිවාරණයක් හෝ පිළියමක් ලෙස යම් ඖෂධයක්, වෛද්‍ය උපකරණයක් සහ සීමාස්ථ නිෂ්පාදනයක් මහජනතාවට ප්‍රචාරණය කිරීම හෝ ප්‍රවර්ධනය කිරීම නොකළ යුතුය.

7. මෙම නියෝග වල විධිවිධාන උල්ලංඝණය කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, 2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 131 වන වගන්තිය යටතේ අධිකරණය ඉදිරියේ නඩු පවරනු ලැබිය යුතුය.

DRAFT